# මාන්තෙයි නැගෙනහිර ප්‍රදේශීය සභාව

## මුලතිව් දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 26 දින විගණන සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 11 දින ඉදිරිපත් කරන ලදි. වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මැයි 14 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනයන්ට කෙරෙන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

( අ ) අයවැය ලේඛණය සහ මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති තථ්‍ය සංඛ්‍යාවන් අතර වෙනස්කම් සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි.

( ආ ) මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරිම සඳහා යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණය කර නොතිබුණි.

(ඇ) ජර්නල් සටහන් 10 ක් සම්බන්ධයෙන් ගනුදෙනු වල විස්තර සඳහන් කර නොතිබුණු අතර එම සටහන් සභාපතිවරයා සහ ලේකම්වරයා විසින් අත්සන් කර නොතිබුණි.

## 1.3.2 . ගිණුම්කරණ අඩුපාඩු

ආදායම් සහ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන් හි නිරික්ෂණය වු ගිනුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දක්වා ඇත.

| මූල්‍ය ප්‍රකාශනයන් කෙරෙහි බලපෑම | ආදායම | | වත්කම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | 01 | 32,940,349 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 372,585 | - | - |

## 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.4,617,565 ක් වු ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

## 2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.548,103 ක් වු අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.720,983 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

රු.17,646,438 ක් වූ සංවර්ධන සංචිතය අපේක්ෂිත අරමුණු සඳහා යොදවා නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු. 000 |
| i | වරිපනම් සහ බදු | - | - | 22.5 |
| ii | කල්බදු | 80 | 230.3 | - |
| iii | බලපත්‍ර ගාස්තු | 325 | 46.33 | - |
| iv | වෙනත් ආදයම් | 5,082 | 4561.057 | - |

### 2.3.2 උසාවි දඩ

2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.797,503 ක් විය.

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් සනාථ නොවූ ගනුදෙනු

ලියා හැරීම සඳහා අනුමැතිය ලබා නොගෙන වටිනාකම රු.1,279,263 ක් වූ වත්කම් ලියා හැර තිබුණි.

2.5 මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.9,182 ක් වූ අත්තිකාරම් ගෙවීම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණු අතර මෙම තත්ත්වය ඉකුත් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාවෙන්ද පෙන්වා දෙන ලදි.

(ආ) 2010 වර්ෂය සඳහා වූ එකතු කළ අගය මත බදු අඩු කිරීම් රු.34,260 ක් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණු අතර විවිධ තැන්පතු ගිණුමට මාරු කර තිබුණි

(ඇ) මුදල් සහ ගබඩා පරිහරණය කරනු ලබන නිලධාරින්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) වාහන උපයෝජනය

(ඉ) විවිධ තැන්පතු

(ඊ) අයවැය පාලනය